2026.03.16

**<u>එක්සත් ජාතික පක්ෂ සභාපති, හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා ඊයේ (15) සවස ගාල්ල උළුවිටිකේ එක්සත් ජාතික පක්ෂ දිස්ත්‍රික් කාර්යාලයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී පළ කල අදහස්</u>**

එක්සත් ජාතික පක්ෂය මේ වනවිට ජාතික වශයෙන් කරන වැඩපිළිවලම ප්‍රාදේශීය වශයෙන් කරගෙන යාමට සියලු වැඩකටයුතු සූදානම් කර තිබෙනවා. අපි මේ දැනුවත් කිරීමේදී අපි කියන තව කාරණයක් තමයි සියලු දේශපාලන පක්ෂත් සමග ගමේ එකට වැඩ කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙන්න කියලා. ඒක අපි කිව්වත් නැතත් ගමේ තිබෙන සමුපකාර ඡන්ද සහ ප්‍රාදේශීය ඡන්ද සියල්ලෙන්ම ජනතාව ඔප්පු කර තිබෙනවා. මහජනතාව එකට එකතු වෙලා වර්තමාන පාලන තන්ත්‍රය පරාජය කරමින් තිබෙනවා. ඒකම තමයි ජාතික වශයෙන් ක්‍රියාත්මක කරන්න සිදු වෙන්නේ.

මම හිතන විදිහට වර්තමාන ආණ්ඩුවට ජනතාව මේ වනවිටත් පණිවිඩය දීලා ඉවරයි. ගාල් දිස්ත්‍රික්කය ගත්තොත් ප්‍රාදේශීය ඡන්ද, සමුපකාර ඡන්ද, එහෙම නැත්නම් සමුපකාර රෝහල්වල ඡන්ද සියල්ලකින්ම රජය පරාජය කර තිබෙනවා. රජයේ මතවාදයත් ඒකම තමයි, මොකද රජය ඉතිහාසයේ ප්‍රකාශ කර තිබුණා ජනතාවගේ මතය මැනගන්න පුළුවන් ප්‍රාදේශීය ඡන්දයෙන් කියලා. එතකොට ප්‍රාදේශීය ජනතාව දේශපාලන පක්ෂවලටත් ආණ්ඩුවටත් පණිවිඩයක් දීලා ඉවරයි. ඒකෙන් පිට දේශපාලන පක්ෂවලටවත් ආණ්ඩුවටවත් වැඩ කරන්න බැහැ.

ඒ වගේම මේ වෙලාවේ ලෝකයේ පවතින යුධමය තත්ත්වය පිළිබඳවත් අපි සැලකිලිමත් වෙන්න ඕන. යුද්ධයක් කියන්නේ නරක දෙයක්. හැබැයි යුද්ධ නිසා නරක දේවල් වගේම ගොඩක් විශාල නැගිටීම් සිදුවෙලා තිබෙනවා. දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ ලෝකයේ විශාල නැගිටීමක් සිද්ධ වුණා. ඕනෑම යුද්ධයක අවසාන ප්‍රතිඵලය තාක්ෂණය මතුවෙනවා, දැනුම මතුවෙනවා, නොයෙක් දේවල් මතුවෙනවා. හානි සිදුවෙනවා, වාසි සිදුවෙනවා. මේ වගේ ලෝකයේ යුධමය තත්ත්වයක් තිබෙන අවස්ථාවකදී ලෝකය සමඟ ගනුදෙනු කරන්න පුළුවන් ලෝක නායකයන් ගෙදර තබා තිබීම ඡන්දදායකයන් විසින් කරගත්තු තමන්ගේ වටිනා ඡන්දය බින්දුව ලකුණට සලකුණු කර ගැනීමක් විදිහට අපි දකින්නේ.

මේ මොහොතේ සියලු දේශපාලන පක්ෂ එකට වැඩකරමින් සිටිනවා. මොකද මේ රට මින් ඉදිරියට කිසිම දේශපාලන පක්ෂයක නියෝජිතයෙකුට රනිල් ගිය පාරෙන් ඇර වෙන පාරකින් ගොඩගන්න බැහැ. එහෙනම් ඒ පාරේ විතරයි යන්න තිබෙන්නේ. වෙන පාරක් තිබුණා නම් මේ ආණ්ඩුව ඒ පාරේ යනවා. මේ ආණ්ඩුව ගිහිල්ලා තිබෙන්නෙත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ගිය පාරේමයි. නමුත් ඒ පාරේ අනවබෝධයෙන් ඉදිරියට යන්න බැහැ. ඒ පාරේ ඉදිරියට යන්න නම් අත්දැකීම් සහ පළපුරුද්ද අනිවාර්යයයෙන් අවශ්‍ය වෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඒ අත්දැකීම් සහ පළපුරුද්ද තිබුණා.

මෙම මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්න සහ වජිර අබේවර්ධන මහතා ඒවාට ලබාදුන් පිළිතුරු පහත දැක්වේ.

**ප්‍රශ්නය -**

මේ දවස්වල දැඩි කතා බහකට ලක්වෙනවා අවුරුදු චාරිත්‍ර සම්බන්ධයෙන් ආණ්ඩුවට තාමත් එකඟතාවයකට එන්න බැරි වුණා කියලා. මේ ගැන ඔබ දකින්නේ කොහාමද?

**පිළිතුර -**

මම ලංකාවේ හිටපු ස්වදේශ කටයුතු අමාත්‍යවරයා. මගේ අමාත්‍යාංශයේ කමිටු ගණනාවක් තිබෙනවා. එකක් තමයි රජයේ නිවාඩු තීරණය කිරීම. බෞද්ධ නිවාඩු, කතෝලික නිවාඩු, මොනවාද හින්දු නිවාඩු, මොනවාද මුස්ලිම් ආගමේ නිවාඩු. ආදී වශයෙන්. අපි මේවා සකස් කලාම සාමාන්‍යයෙන් ගැසට් කරන්න කළින් ඒ ඒ ආගමික නායකයන් එක්ක සාකච්ඡා කරලා බලනවා මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ තිබෙන අදහස පිළිබඳව. ඒ පිළිබඳ එකඟතාවයක් තියෙනවා නම් තමයි ගැසට් කරන්නේ. ඒකට සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් තියෙන්න ඕනේ. උදාහරණයක් හැටියට ගත්තාම නැකත් කමිටුවේ මේ පළවෙනි වතාව නෙවෙයි ඔය වගේ ප්‍රශ්න එන. ඉතිහාසයෙත් ඔය වගේ විවිධ මත ඉදිරිපත් කරලා තිබෙනවා.

එතකොට එවැනි අවස්ථාවල මට මතකයි සමහරවිට මාධ්‍යයත් ගෙනල්ලා ගැසට් කරන්න කලින් මාධ්‍යයේ සාකච්ඡා පවත්වලා එකඟතාවය අරගෙන තිබෙනවා.

ඊට පස්සේ ජාතික අවශ්‍යතාවය අනුව, මොකද අපේ සංස්කෘතිය වැදගත්, අපේ ඉතිහාසය වැදගත්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙනවා අපේ සංස්කෘතිය ආරක්ෂා කරන ආකාරය. ඒක අනුගමනය කරන්න තිබෙනවා. ඉතින් ඒක කඩාබිඳ දමලා තිබෙනවා. ඉතින් ඒ ගැන අපිට තියෙන්නේ ජාතියක් හැටියට කණගාටුව පමණයි.

**ප්‍රශ්නය -**

මේ දිනවල ලෝකය තිබෙන්නේ දරුණු යුද්ධයක් අභිමුඛව. මේ ගැන ඔබේ මතය සහ මින් ලංකාවට කුමන ආකාරයේ බලපෑමක් එල්ල වෙයිද?

**පිළිතුර -**

මේක ගැන ශ්‍රී ලාංකික මහජනතාවත් දැනගත යුතු කාරණය තමයි රටක් පාලනය කරනකොට ඒ අයට දැනුමක් තිබෙන්න ඕනේ ලෝකයේ වෙන දේවල් පිළිබඳව. ඒ අයට දැනුමක් තිබෙන්න ඕන ට්‍රම්ප් පරිපාලනය මොනවාද කරන්නේ කියලා. ඒ අයට දැනුම තිබෙන්න ඕන රුසියාව මොනවාද කරන්නේ කියලා. ඒ අයට දැනුම තිබෙන්න ඕන අපේ අසල්වැසි ඉන්දියාව මොකක්ද කරන්නේ කියලා.

ඒකට දැන් සැලසුම් කරන්න බෑ. දැන් සැලසුම් කරනකොට මහජනතාව පීඩනයට පත්විය වෙලා ඉවරයි. ඒක ගැන ක්‍රියා කරන්න තිබුණේ 2025 දී. එතකොට අපි බලන්න ඕන රජය බ්‍රික්ස් (BRICS) සමුළුවට සහභාගී වුණාද, ඒවායේදී අදාළ ගතයුතු තීරණ ගත්තාද, ඒවායේදී අදාළ කටයුතු හරියට ඉදිරිපත් වුණාද කියලා.

මොකද රටකට විදේශ ප්‍රතිපත්තිය ඉතා වැදගත්. මේ ප්‍රශ්නය ඇතිවුණාම විදේශ ප්‍රතිපත්තිය ගැන හිතලා වැඩක් නෑ. ප්‍රශ්නය එන්න කලින් විදේශ ප්‍රතිපත්තිය දකින්න ඕනේ. ඒක දකින්න නම් ඒ පිළිබඳ පළපුරුද්දක්, අත්දැකීමක් තිබෙන රාජ්‍ය පාලකයෙක් රටේ ඉන්න ඕනේ. එවැනි දැක්මක්, ඇතැක් ජේන රාජ්‍ය නායකයෙක් හිටියා රනිල් වික්‍රමසිංහ මහත්මයා, නමුත් ජාතියේ අවසානවට අපේ මහජනතාවය එතුමාට ගෙදර ඉන්න කිව්වා. දැන් මේ වෙන දේවල් කළමනාකරණය කිරීම ඉතා අමාරුයි, දැන් තිබෙන්නේ මහජනතාවට ඒ සඳහා මුහුණදීම පමණයි.

**ප්‍රශ්නය -**

ඒ වගේම තමයි දැන් මේ ඉන්ධන මිල සම්බන්ධයෙන් කතා කරද්දී සමාජයේ කතාබහක් ඇති වුණා ලොකු බදු ප්‍රමාණයක් ඉන්ධනවලට අඟුවෙනවා කියලා. මේ බදු ප්‍රමාණය අඩු කරලා ජනතාවට සහනයක් දෙනවා කියලා තමයි වර්තමාන රජය බලයට ආවේ. ඒ ගැන මුකුත් ඔබට ප්‍රකාශ කරන්න පුලුවන්ද?

**පිළිතුර -**

මම හිතන්නේ ආණ්ඩුව විපක්ෂයේ ඉන්නකොට කියපු ටික මේ මාධ්‍යවේදීන් දන්නවා. ඒ ටික අරගෙන එක වීඩියෝවක් හදලා මාධ්‍යයට දැම්මනම් මහජනයාට තේරෙයි මොනවාද කියලා තියෙන්නේ කියලා.

**ප්‍රශ්නය -**

ඒ වගේම තමයි පළාත් සභා විසිරුවලා දැන් ඉතා විශාල කාලයක් වෙනවා. ඇයි මෙය පවත්වන්න කියලා ඔබතුමන්ලා රජයට බල කරන්නේ නැත්තේ?

**පිළිතුර -**

මම හිතන්නේ පාර්ලිමේන්තුව විසිරුවොත් හොඳයි නේද? මොකද මෙහෙම රටකට ඉදිරියට යන්න බැහැනේ.

**ප්‍රශ්නය -**

ඒ වගේම සභාපතිතුමා දැන් රටේ ගෑස් හිඟයක් ඇති වෙලා කියලා මහජනතාව මැසිවිලි නගනවා. ඒ වගේම ජනතාවට ගෑස් ගන්න පෝලිම්වලට වෙලා ඉන්න වෙලා. මේ තත්ත්වය ගැන මොකක්ද කියන්න පුළුවන්?

**පිළිතුර -**

මම හිතන්නේ ඔයාලා ප්‍රශ්න අහන්නේ නැතුව දැන්ම ගෑස් පෝලිමට ගියොත් හොඳයි. නැත්නම් ඔයාලටත් ගන්න ගෑස් නැති වෙයි.

එක්සත් ජාතික පක්ෂ සභාපති,
හිටපු අමාත්‍ය **වජිර අබේවර්ධන**
මාධ්‍ය ඒකකය